# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1565 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 11/10/2024 පැය 0550

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

### 01. මනුෂ්‍ය ඝාතනයක් - ඕමන්ත පොලිස් වසම.

2024.10.10 වන දින සවස් කාලයේදී ඕමන්ත පොලිස් වසමේ වන්නාන්කුලම් ප්‍රදේශයේ පුද්ගලයෙකුට තියුණු ආයුධ වලින් පහරදීමක් හේතුවෙන් වව්නියාව රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ඕමන්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ අරසන්කුලම්, ඕමන්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුඹුරක් සම්බන්ධයෙන් දෙපාර්ශවයක් අතර ඇති වූ ආරවුලක් මත පුද්ගලයින් 05 දෙනෙකු විසින් මරණකරු සහ ඔහුගේ ඥාතියෙකු හට කැත්තකින්, උදැල්ලකින් හා පොල්ලකින් පහර දී මෙම ඝාතනය සිදුකර ඇති අතර පහරකෑමට ලක් වූ මරණකරුගේ ඥාති පුද්ගලයා වව්නියාව රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී.

මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඝාතනයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයක් - කඳාන පොලිස් වසම.

2024.10.09 වන දින සවස් කාලයේදී කඳාන පොලිස් වසමේ උතුරු බටගම ප්‍රදේශයේ පුද්ගලයෙකු කාන්තාවකට පහරදීමක් හේතුවෙන් එම කාන්තාව රාගම රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල වෙත ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී 2024.10.10 වන දින උදෑසන කාලයේ මියගොස් ඇති බවට කඳාන පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 32 ක් වූ උතුරු බටගම, ජාඇල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය හා පුරුෂයා අතර ඇති වූ බහින් බස්වීමක් විසඳීම සඳහා පුරුෂයාගේ මස්සිනා එම ස්ථානයට පැමිණ ආරවුල විසඳීමට යාමේදී ඔහු විසින් මරණකාරිය තල්ලු කිරීමකදී බිම ඇද වැටීම හේතුවෙන් මෙම මරණය සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඝාතනයට සම්බන්ධ වයස අවුරුදු 33 ක් වන උතුරු බටගම ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමග සැකකාරියක් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.10.10 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට හා රත්මලාන ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 750 ක් සමග සැකකාරියක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 520 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 29 ක් වන බඩෝවිට ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර සැකකරු අවුරුදු 38 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.10.10 වන දින දහවල් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන හා බෙලෙක් කඩේ හන්දිය ප්‍රදේශවලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 04 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් සිව් දෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19, 20, 30 හා 50 යන වයස්වල පසුවන රත්මලාන හා මොරටුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2024.10.10 වන දින දහවල් කාලයේදී අතුරුගිරිය පොලිස් වසමේ ඔරුවල ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.

2024.10.10 වන දින සවස් කාලයේදී පෑලියගොඩ පොලිස් වසමේ දරමඩු වත්ත ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන දුටුගැමුණු මාවත, පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. රැඳවුම් නියෝග මත සිටි සැකකරුවෙකුගෙන් ගෙවල් බිඳ දේපල සොරකම් රැසක් අනාවරණය කර ගැනීම - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.10.08 වන දින මිනුවන්ගොඩ පොලිස් ස්ථානය මඟින් අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු මිනුවන්ගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2024.10.13 දින දක්වා රැඳවුම් නියෝග මත මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන සිටි වයස අවුරුදු 42 ක් වූ දෙවලපොල ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු සම්බන්ධව ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් විමර්ශනය සිදුකර ගම්පහ කොට්ඨාසයේ පොලිස් ස්ථාන කිහිපයක සිදුකර ඇති ගෙවල් බිඳුම් සම්බන්ධ තොරතුරු අනාවරණය කරගෙන ඇත.

ඒ අනුව යක්කල, වීරගුල,මල්වතුහිරිපිටිය, දොම්පේ සහ මිනුවන්ගොඩ පොලිස් වසම්වල සිදුකළ ගෙවල් බිඳුම් 09 ක් සම්බන්ධ අනාවරණය කරගෙන ඇත. සැකකරු සොරකම් කරන ලද වතුර මෝටර් 01, ප්‍රෙෂර් ගන් 03, බෆල් 01, ගෑස් සිලින්ඩර් 04, විදුලි ජනක 01, තණකොළ කපන මැෂින් 02, චේන් ෂෝ 01 ක් හා වාහන බැටරි 02 ක් සොයාගෙන ඇත.

සැකකරු සමඟ ඉහත අපරාධ සඳහා එක් වූ තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම සඳහා ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවකු අත්අඩංගුවට - නෝර්වුඩ් පොලිස් ස්ථානය.

2024.10.10 වන දින සවස් කාලයේ නෝර්වුඩ් පොලිස් වසමේ එල්බඩ පහළ කොටස වතුයාය ප්‍රදේශයේදී නෝර්වුඩ් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 70 ක්වූ බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. වගා ළිඳකට වැටී කාන්තාවක් මියයාම - අච්චුවේලි පොලිස් වසම

2024.10.10 වන දින සවස් කාලයේ අච්චුවේලි පොලිස් වසමේ නවග්ගිරි පුත්තූර් උතුර ප්‍රදේශයේදී කාන්තාවක් වගා ළිඳකට වැටී මියගොස් ඇති බවට ලද තොරතුරක් මත අච්චුවේලි පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 60 ක් වන නවග්ගිරි, පුත්තූර් උතුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය නිවසේ තනිවම වාසය කර ඇති බවත්, දහවල් කාලයේ සිය සහෝදරිය විසින් දිවා ආහාරය ද ගෙනවිත් දී ඇති අතර පසුව සවස් කාලයේ මරණකාරිය නිවසේ නොසිටි බැවින් සිදුකල පරීක්ෂාවේදි ඉඩමේ පිහිටි වගා ළිඳක තිබී මෘත ශරීරය සොයා ගෙන ඇති බවත් විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අච්චුවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. ගණිකා නිවාසයක් වටලා සැකකාරියන් පස්දෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් වසම.

2024.10.10 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාසයක් වටලා ගණිකා නිවාසයක් කළමනාකරණය කිරීම සම්බන්ධව සැකකාරියක් සහ ගණිකා වෘත්තියේ යෙදී සිටි සැකකාරියන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් වයස අවුරුදු 21, 22, 24, 39 හා 41 වයස්වල පසුවන පිලියන්දල, වෙන්නප්පුව, වෙරළ පනාතර, රත්මලාන සහ මඩපාත ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - මාරවිල පොලිස් වසම.

2024.10.10 වන දින උදෑසන කාලයේ මාරවිල පොලිස් වසමේ උතුරු මුදුකටුව ප්‍රදේශයේ වෙරල තීරයට පිරිමි මළ සිරුරක් ගොඩ ගසා ඇති බවට ලද පණිවිඩයක් මත මාරවිල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර වයස අවුරුදු 30 ත් 40 ත් අතර වන අඩි 05 යි අඟල් 0 3ක් වන වම් අතේ තරුව හා අඩ හඳ සහ මාළුවෙකුගේ රූපයක් පච්ච කොටා ඇත. මළ සිරුර අධික ලෙස නරක් වී ඇති අතර මෘත ශරීරයේ දකුණු අත සහ වම් කකුල නොමැත.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාරවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - හබරණ පොලිස් වසම.

2024.10.10 වන දින උදෑසන කාලයේ හබරණ පොලිස් වසමේ හබරණ පොළොන්නරුව ප්‍රධාන මාර්ගයේ අඹගස්වැව ප්‍රදේශයේදී හබරණ දෙස සිට පොළොන්නරුව දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ දකුණු පසට ධාවනය වී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කැබ් රථයක ගැටී කැබ් රථය පෙරලී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කැබ් රථයේ රියදුරු හබරණ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ ඊරිගේඔය, හබරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හබරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - පරසන්ගස්වැව පොලිස් වසම.

2024.10.10 වන දින සවස් කාලයේ පරසන්ගස්වැව පොලිස් වසමේ අනුරාධපුර යාපනය ප්‍රධාන මාර්ගයේ ගෝනෑව හන්දියෙන් වමට ඇති පණ්ඩුකාභයපුර ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට පණ්ඩුකාභයපුර දෙසට ගමන් ගත් පාපැදියක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු හා යතුරුපැදිකරු රඹෑව රෝහලට ඇතුලත් කිරීමේදී පාපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 96 ක් පණ්ඩුකාභයපුර, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රඹෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. පරසන්ගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**